# දෙමව්පියනි, වැඩිහිටියනි අවධානයෙන් සිටින්න..!

## ඔබේ දරුවන් ආරක්ෂා කර ගන්න.

**ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ඔබගේ වගකීම ඉටු කරන්න.**

නිරන්තරයෙන් ඔබ ඔබේ දරුවන් සමඟ කාලය ගත කරන්න.





ඔබගේ දරුවා වැරදි දෙයක් සිදු කර ඇත්නම් එය වැරදි දෙයක් වන්නේ මක් නිසාද යන්න සහ එහි ප්‍රතිවිපාක මොනවාද යන්න පැහැදිලි කර දෙන්න.

ඔබේ දරුවා යම් අවධානම් තත්වයක් ගැන හෝ වේදනාවක් ගැන පවසයි නම් ඒ පිළිබඳව සැලකීමෙන් ක්‍රියා කරන්න.





දරුවන්ට සවන් දෙන්න. ඔවුන් පවසන දෙය පිළිබඳව සැලකිලිමත් වන්න.



ඔබ ඔබගේ දරුවා සමඟ තරහින් සිටින විට පරුෂ වචන භාවිත කිරීම හෝ කුරිරු දේ සිදු කිරීම නොකර සාධාරණ ආකාරයට ප්‍රතිචාර දැක්වීමට තරම් ඔබ සන්සුන් වන තුරු බලා සිටින්න.



ඔබේ දරුවා ඔබ කෙරෙහි තබා ඇති විශ්වාසය ආරක්ෂා කරගන්න.

ඔබේ දරුවා සිටින්නේ කුමන ස්ථානයක, කා සමඟද යන්න පිළිබඳව නිරන්තර අවධානයෙන් සිටින්න.



ඔබගේ මඟ පෙන්වීම යටතේ තෝරා ගැනීම් සහ තීරණ ගැනීම් සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න. ඔවුන්ගේ හැසිරීම් පිළිබඳ අවධානය යොමු කරන්න.





ඔබගේ දරුවන් සිතන පතන අයුරු වටහා ගන්න. (එමඟින් ඔවුන්ගේ වෙනස් වීම් හඳුනා ගත හැකිවේ.)



සෑම විටම ඔබ ඔබගේ දරුවන් සමඟ විවෘතව සාකච්ඡා කරන්න. ඔවුන්ගේ ළඟම මිතුරා මිතුරිය වීමට වග බලාගන්න.

කුඩා කළ සිටම දරුවාට සමාජයේ තිබෙන අනාරක්ෂිත දෑ පිළිබඳ අවබෝධ කර දෙන්න.



ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය

ChildLine Sri Lanka

1929

## දරුවන් යනු රටේ සම්පතයි. ඔවුන් රැක ගැනීම ඔබ සතු වගකීමකි.

කුමන හෝ ස්ථානයක ළමා අපයෝජනයක් සිදුවේ නම් ළඟම ඇති පොලිස් ස්ථානයට හෝ 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ඇමතීමෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට දැනුම් දෙන්න.

NATIONAL CHILD PROTECTION AUTHORITY SRI LANKA

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

අංක - 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.

දු.ක: 0112 778912-14 ෆැක්ස්: 0112 778915 වෙබ් අඩවිය: www.childprotection.gov.lk විද්‍යුත් තැපෑල: ncpa@childprotection.gov.lk

Designed & Printed by: M.D.GUNASENA & CO. PRINTERS (PVT) LTD.